# ප්‍රාග්ඓතිහාසික අලවල, පාහියංගල සහ කුරගල ආශ්‍රිත භූ දර්ශනය

කේ.ඩී. නීලිකා ප්‍රියදර්ශනී
රුචිර සහන් රාජපක්ෂ

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
nilika1991@gmail.com
ruchirarajap@gmail.com

---

ශ්‍රී ලංකාව භූ විෂමතාවය සහ දේශගුණය වැනි සාධක පදනම් කරගනිමින් වියළි කලාපය, අතරමැදි කලාපය සහ තෙත් කලාපය ලෙස වර්ග කළ හැකිය. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික අවධිය පිළිබඳව අධ්‍යයනයේදී තෙත් කලාපයට සහ අතරමැදි කලාපයට ලැබෙනුයේ විශේෂිත ස්ථානයකි. මෙම පර්යේෂණය තෙත් කලාපීය ප්‍රාග්ඓතිහාසික ක්ෂේත්‍ර ද්විත්වයක් වන අලවල පොත්ගුල් ලෙන සහ පා-හියන් ලෙන ද අතරමැදි කලාපයේ මෝසම් වනාන්තරයක පිහිටි කුරගල ප්‍රාග්ඓතිහාසික ලෙන ද මත පදනම් විය. මෙම පර්යේෂණය තුළින් පූර්ව වාර්තා සහ ක්ෂේත්‍ර ගවේෂණ හරහා අදාළ ක්ෂේත්‍රයන් ත්‍රිත්වයේ භූ දර්ශනයේ විශේෂත්වයන් අවබෝධ කරගැනීමට උත්සහ දරනු ලැබිණි.

පර්යේෂණය හරහා ස්ථාන ත්‍රිත්වයේම සමාන ලක්ෂණ ලෙස ගුහාවට සමීපව ජල මාර්ගයක් පිහිටා තිබීම, සූර්යයා ලෝකය හොඳින් ලැබෙන ආකාරයට ගුහා විවරය සැකසී තිබීම සහ සාගරය සමග සම්බන්ධතා ගොඩනගා ගත හැකි ලෙස භූ දර්ශන උපයුක්ත කරගැනීම දැක්විය හැකිය. නයිස් පාෂාණයෙන් නිර්මිතව ඇති අලවල, පා-හියන් ලෙන සහ කුරගල ගුහාවන්හි ආරක්ෂිත ස්වභාවය, වැඩි පිරිසකට එකම ස්ථානයේ ජීවත්වීමේ හැකියාව ආදී ලක්ෂණ කෙරෙහි මෙම මානවයන් සැලකිලිමත් වන්නට ඇත. අලවල සහ පාහියන් ලෙන මානවයා තෙත් කලාපීය භූ දර්ශනය මනාව ග්‍රහණය කරගෙන ඊට අනුයෝජනය වී සම්පත්වලින් උපරිම ඵල ලබාගෙන ඇති අතර සමසීත දේශගුණයක් තුළ වාසය කිරීමේ හැකියාවෙන් ද යුක්තවී තිබේ. එහෙත් කුරගල මානවයා අධික ශීතල මෙන්ම අධික වියළි දේශගුණයන්ට ද මුහුණදීම තුළින් එම දේශගුණික තත්ත්වයන් දෙක තුළම වාසය කිරීමේ හැකියාවන් අත්පත් කරගත් බව සිතිය හැකිය. වියළි කලාපය තුළ එළිමහන් ජනාවාසයක් සහ වර්ෂා කාලයේ දී ගුහා අභ්‍යන්තරය ප්‍රයෝජනයට ගත් මානවයන් පිරිසක් ලෙස කුරගල මානවයන් වැදගත් වේ. මෙම තත්ත්වය තුළ ස්වභාවික, දේශගුණික සහ කාලගුණික වෙනස්වීම් තුළ අලවල සහ පා-හියන් ලෙන ප්‍රාග්ඓතිහාසික මානවයාට සාපේක්ෂව කුරගල ප්‍රාග් මානවයාට පරිසරානුයෝජනයවීමේ ප්‍රවණතාව ඉහළ අගයක් ගත් බව පැහැදිලි වේ.

ප්‍රමුඛ පද : තෙත් කලාපය, අතරමැදි කලාපය, ප්‍රාග්ඓතිහාසික, පරිසරානුයෝජනය